# සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය

## තනතුරු - පුරප්පාඩු

සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත්‍ර කැඳවනු ලැබේ.

### 01. තනතුර : ප්‍රධාන මූල්‍ය කළමනාකරු III (E.2) - පුරප්පාඩු සංඛ්‍යාව 01

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

1. පිලිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණ, ව්‍යාපාර කලමනාකරණ, වාණිජ පශ්චාත් උපාධියක් සමඟ පිලිගත් ආයතනයක ගිණුම්/විගණන ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 02 ක පලපුරුද්ද

   හෝ

2. පිලිගත් විශ්වවිද්‍යාලයක ගණකාධිකරණ, ව්‍යාපා ර කලමණාකරණ, වාණිජ උපාධියක් සමඟ පිලිගත් ආයතනයක ගිණුම්/විගණන ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 04 ක පලපුරුද්ද

   හෝ

3. කාර්මික විද්‍යාලයේ හෝ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයක සිව්වසරක ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාව සමඟ පිලිගත් ආයතනයක ගිණුම්/විගණන ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ තනතුරක වසර 05 ක පලපුරුද්ද

   හෝ

4. ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ දෙවන අදියර සමත්වීම හෝ වරලත් කලමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනයේ අවසන් අදියර සමත් වීම සමඟ පිලිගත් ආයතනයක ගිණුම්/විගණන ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 05 ක පලපුරුද්ද

➢ **වැටුප** රු.57,400 - 1200X10-1350X10-1,550X5 - 1,800X10 - 115,650

### 02. තනතුර : කළමනාකරු (සංවර්ධන) III (E.3.1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

1. පිලිගත් විශ්වවිද්‍යාලයකින් බඳවා ගැනීම සිදු කරනු ලබන ක්ෂේත්‍රයට අදාල උපාධිය සමඟ විධායක මට්ටමේ වසර 03 ක පලපුරුද්ද

   හෝ

2. අ.පො.ස. උ/පෙළ සාමාර්ථය සමඟ පිලිගත් ආයතනයකින් අදාල ක්ෂේත්‍රය සම්බන්ධ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ අදාල ක්ෂේත්‍රයේ විධායක මට්ටමේ වසර 05 ක පලපුරුද්ද

   හෝ

3. පිලිගත් විශ්වවිද්‍යාලයකින් බඳවා ගැනීම සිදු කරනු ලබන ක්ෂේත්‍රයට අදාල උපාධිය සමඟ බඳවා ගැනීම සිදු කරනු ලබන සමුපකාර සමිතියේ /සංගමයේ මාණ්ඩලික නිලධාරි තනතුරක වසර 05 ක පලපුරුද්ද

   හෝ

4. අ. පො. ස. උ/පෙළ සාමාර්ථය සමඟ පිලිගත් ආයතනයකින් අදාල ක්ෂේත්‍රය සම්බන්ධ වසරකට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සමත්වීම සමඟ බඳවා ගැනීම සිදුකරනු ලබන සමුපකාර සමිතියේ /සංගමයේ මාණ්ඩලික නිලධාරි තනතුරක වසර 07 ක පලපුරුද්ද

➢ **වැටුප** - රු.50,600 - 900X10-995X10-1,110X5 - 1,250X10 - 92,710

### 03. තනතුර : අභ්‍යන්තර විගණක III (E.3.1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

1. පිලිගත් විශ්වවිද්‍යාලයක වාණිජ/ කලමනාකරණ/ ගණකාධිකරණ ක්ෂේත්‍රයේ උපාධිය සමඟ පිලිගත් ආයතනයක ගිණුම්/විගණන ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 03 ක පලපුරුද්ද

   හෝ

2. කාර්මික විද්‍යාලයේ හෝ උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයක වසර 04 ක ගණකාධිකරණ / වාණිජ ඩිප්ලෝමාව සමඟ පිලිගත් ආයතනයක ගිණුම් /විගණන ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 03 ක පලපුරුද්ද

   හෝ

3. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ දෙවන අදියර සමත්වීම සමඟ පිලිගත් ආයතනයක ගිණුම් විගණන ක්ෂේත්‍රයේ විධායක තනතුරක වසර 04 ක පලපුරුද්ද

➢ **වැටුප** - රු.50,600 - 900X10-995X10-1,110X5 - 1,250X10 - 92,710

### 04. තනතුර : කාර්යාල කාර්ය සහායක II (පියන් තනතුර S.1) - පුරප්පාඩු සංඛ්‍යාව 01

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් :**

1. දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. සා/පෙළ සමත්වීම

➢ **වැටුප** - රු.35,100 - 290X10-320X10-370X10 - 45,830

❖ **පොදු කොන්දේසි**

01. මූලික වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව රු.17,800/- හා සමුපකාර සේවක කොමිෂන් සභාවේ අනුමත දීමනා ද හිමි වේ.

02. වයස් සීමාව අවු. 18 ත්, අවු.45 ත් අතර විය යුතුය. දැනට සමුපකාර ක්ෂේත්‍රයේ ස්ථිර සේවයේ යෙදී සිටින අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලනොපානු ඇත.

03. මෙම තනතුරු සේවක අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට දායක වන ස්ථිර තනතුරු වේ.

04. සේවයට බඳවාගත් පසු වසර 02 ක පරිවාස කාලයකට යටත් විය යුතුය.

05. තනතුරට අදාල පලපුරුද්ද හා නිපුනතාවයන් විශේෂ සුදුසුකමක් වනු ඇත.

06. සියළුම ඉල්ලුම්පත්‍ර, අධ්‍යාපන හා පලපුරුද්ද පිලිබඳව සහතික වල, ජාතික හැඳුනුම්පත සහ පදිංචිය සනාථ කිරීම පිලිබඳව ග්‍රාමසේවක සහතිකයේ සහතික කල පිටපත් සමඟ 2026-04-20 දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍ර එවනු ලබන ලියුම් කවරයේ වම් ඉහල කෙලවරේ තමන් අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර එවිය යුතුය.

07. ලියාපදිංචි සමුපකාර සමිති/ සංගම්හි සේවයේ නියුක්ත වුවත් තම ආයතන ප්‍රධානියා මාර්ගයෙන් අයදුම්පත්‍ර ඉදිරිපත් කල යුතුය.

**සභාපති,**
**සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය,**
**අංක 724/1/1, බියගම පාර, පිලපිටිය, කැළනිය.**
**දු.අ. 011-2918657**
**2026.04.03**